උතුරු පළාත් සභාව - 2018

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

උතුරු පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 28 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට

ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් රැස්කිරීම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි යාන්ත්‍රික අංශයෙහි 2018 ජනවාරි 01 සිට 2019 මැයි 19 දක්වා වූ කාලයට අදාළව රැස්කරන ලද කුලී ආදායම් රු.642,750 ක් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට රැගෙනවිත් නොතිබුණි. | සත්‍ය ආදායම ගණනය කර වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට රැගෙන ආ යුතුය. | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරමින් පවති. |

(ආ) දේපළ, පිරියත හා උපකරණ

----------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | ------------------------------------ |
| (01) | අමාත්‍යාංශ දෙකක හා දෙපාර්තමේන්තු 10 කට අදාළව පෙර වර්ෂයේ අවසානයට පැවති ජංගම නොවන වත්කම්වල මුළු එකතුව ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක දිනට ඉදිරියට රැගෙන ඒමේදී රු.මිලියන 709.42 ක වෙනසක් පැවතුණි. | පෙර වර්ෂයේ නිවැරදි ශේෂය ප්‍රවර්ථන වර්ෂයට රැගෙන ආ යුතුය. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආරම්භක ශේෂ ඉදිරියට රැගෙන යාමේදී ඇති වූ දෝෂ හේතුවෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. |
| (02) | ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රවාහන උපකරණවල ප්‍රවර්ථන වර්ෂයේ අවසාන ශේෂය රු.මිලියන 6.84 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට රු.මිලියන 1,260.68 ක් ලෙස රැගෙනවිත් තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.මිලියන 1,253.84 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජංගම නොවන වත්කම්වල නිවැරදි අගය හෙළිදරව් කරන බවට තහවුරු කර ගත යුතුය. | ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආරම්භක වත්කම් වටිනාකම වැරදි ලෙස ගණනය කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් වැඩිපුර පෙන්නුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් උපදෙස් අදාළ නිලධාරීන්ට ලබාදී ඇත. |
| (03) | ප්‍රවර්ථන වර්ෂයේදී ආදායම් දෙපාර්තමේන්තුවට අදාළ මෝටර් සයිකල් දෙකකට අදාළ වටිනාකම වූ රු. මිලියන 1.38 ක් ජංගම නොවන වත්කම් ගිණුමට ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජංගම නොවන වත්කම්වල නිවැරදි අගය හෙළිදරව් කරන බවට තහවුරු කර ගත යුතුය. | වැරදීමකින් ගිණුම්ගත කර තිබුණි. ඉදිරි වර්ෂවලදී ගිණුම්වලට ඇතුළත් කරනු ලැබේ. |

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වව්චර්පත්‍ර, ඉන්වොයිස් පත්‍ර, ප්‍රතිලාභීන්ගේ නාම ලේඛන, ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද ප්‍රමාණ පත්‍ර හා පාසල් සම්බන්ධයෙන් විදුහල්පතිවරුවන් ලබාදෙන සහතික යනාදී අත්‍යාවශ්‍ය සාක්ෂි අදාළ දෙපාර්තමේන්තුවල ගෙවීම් වව්චර්පත්‍රවල නොතිබීම හේතුවෙන් එකතු කළ වටිනාකම වූ රු.මිලියන 13.30 කට අදාළ 136 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය. | ගෙවන ලද වව්චර්පත්‍ර ඊට අදාළ සියලු සාක්ෂි සමඟ ඉදිරිපත් කළ යුතුය. | සාක්ෂි නොමැති වීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන අතර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළ සියලුම සාක්ෂි වහාම ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී. |
| (ආ) | උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවයාගේ උපදෙස් මත ලේඛකයන් හා ජ්‍යෙෂ්ඨ කළාකරුවන් වෙත මූල්‍යාධාර ලෙස "විශ්‍රාම වැටුපක් ලබාදීම" ලෙස නම් කර ප්‍රතිලාභීන් 12 සිට ප්‍රතිලාභීන් 41 කට වර්ෂ 2009 සිට 2018 වර්ෂය දක්වා ගෙවන ලද මුළු එකතුව රු. මිලියන 13.74 ගෙවීමට සම්බන්ධ සාක්ෂි හා එම ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයක් විගණනය වෙත ලබාදී නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයක් හරහා ප්‍රතිලාභීන් තෝරාගත ගෙන ගෙවීම් කළ යුතුය. | දැනට මූල්‍යාධාරක්‍රමයේ පැවති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත. වර්ෂ 2017 ඔක්තෝබර් මාස සිට ජීවත්වන බවට සහතිකයක් ලබාගෙන කලාකරුවන්ට අදාළ මූල්‍යාධාර මුදල ඔවුන්ගේ තනි නති ගිණුම්වලට බැර කරන ලදී. තවද 2019 වර්ෂයේ ජනවාරි මස සිට මූල්‍යාධාර සැපයීමට අදාළ තොරුතුරු සංස්කෘතික භාර නිලධාරියා වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

1.6.3 නීති,රීති හා රෙගුලාසි සඳහා අනුකූල නොවීම

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණය අනුව හෙළිදරව් වූ නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත පරිදි නිරීක්ෂණය විය.

| | නීති,රීති රෙගුලාසි සඳහා යොමුව | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | වටිනාකම රු.මිලියන | අනුකූල නොවීම | | |
| (අ) | උතුරු පළාත් මූල්‍ය රීති (i) අංක 69 | - | ප්‍රවර්ථන වර්ෂයේ හා ඊට ඉකුත් වර්ෂ දෙකකට අදාළ යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙහි වාහන අනතරු 10 කට අදාළ ප්‍රාරම්භක වර්තා විගණනය වෙත ඒවා නොතිබුණි. | අදාළ මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් නියමිත තොරතුරු හා වාර්තා ලබාදීමට අපොහොසත්ව ඇති බැවින් මෙම කාර්යය නිරාකරණය කර ගැනීමට නොහැකි තත්ත්වයට පත්ව ඇත. |
| | (ii) අංක 106 | 1.38 | ප්‍රවර්ථන වර්ෂයේදී ගෙවන ලද පෙරවර්ෂයට අදාළව මුළු එකතුව වූ රු.මිලියන 1.38 කට අයත් මිලදී ගැනීම් 54 කට අදාළ ලැබීම් තහවුරු කර ගැනීමකින් තොරව තෙම්මරාච්චි කලාප අධ්‍යක්ෂ කාර්යාලය විසින් ගෙවීම් සිදුකර තිබුණි. | ආදාළ මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ප්‍රාරම්භක පරීක්ෂණ කටයුතු සඳහා කමිටුවක් 2019.03.14 දින පත්කර ඇති අතර කමිටුව වෙතින් අදාළ වර්තාව ලැබීමෙන් පසුව ඉදිරි පියවර ගනු ලැබේ. |
| | (iii) අංක 108.5 | 0.64 | කොන්ත්‍රාත් වැඩ සිදු කළ පුද්ගලයින් හඳුනා ගැනීමකින් තොරව යාපනය වාවකච්චේරි ඩ්‍රිබෙග් පාසල විසින් විවිධ වූ වැඩ | අදාළ මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ප්‍රාරම්භක පරීක්ෂණ කටයුතු සඳහා කමිටුවක් 2019.03.14 දින පත්කර ඇති අතර කමිටුවක් වෙතින් අදාළ වාර්තාව |

| | | | | |
|---|---|---|---|---|
| | | කොන්ත්‍රාත්තු 18 ක් වෙනුවෙන් පාසලේ එක් ගුරුවරයෙකුට හා තවත් ගුරුවරියකගේ ස්වාමිපුරුෂයකු වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | | ලැබීමෙන් පසුව ඉදිරි පියවර ගනු ලැබේ. |
| (iv) අංක 433 | - | ප්‍රවර්ථන වර්ෂයේදී සෙට්ටිකුලම් මූලික රෝහලෙහි අංක LW-0118 දරන වාහනයට අදාළ මාස තුනක දෛනික ධාවන සටහන්ද 52-5087 අංක දරන වාහනයට අදාළ මාස 06 ක ධාවන සටහන් විගණනය වෙත ලබාදී නොතිබුණි. | අදාළ මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය Vi පරිච්ඡේදයෙහි 7.1 උප වගන්තිය | 0.14 | උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද නිලධාරීන් තුන්දෙනෙකු ප්‍රවර්ථන වර්ෂයේ පෙර දැනුම්දීමකින් තොරව සේවයට වාර්තා නොකිරීම මත සේවය අතහැර ගිය ලෙස සලකා ලිපි යැවීමකින් තොරව මාස | ආයතන සංග්‍රහව අනුව පියවර ගත යුතුය. | <u>අධ්‍යාපන අමාත්‍යාංශ</u> නිලධාරියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලකට අනුයුක්තව සේවය කරන බැවින් සම්බන්ධීකරණ කටයුතුවල ප්‍රමාද හේතුවෙන් සේවය හැර ගිය ලිපිය ප්‍රමාදවීමකින් ලබාදී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 03 සිට මාස 06 දක්වා කාල ප්‍රමාදයන් දක්නට ලැබුණු අතර එම කාලයට අදාළ වැටුප් හා වේතන ද ගෙවා තිබුණි. | | පරිවාස දෙපාර්තමේන්තුව 2018.08.14 දින ලිපිය ප්‍රකාරව සේවය හැරගිය ලිපිය ලබාදී ඇත. 2018 ජුනි මස සිට වැටුප් ගෙවීම් නවතා ඇත. |
| (ඇ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | පළාත් මාර්ග දෙපාර්තමේන්තුවට අයත් දිගු කාලයක සිට භාවිතයට ගත නොහැකි වාහන 20 ක් බැහැර කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවරයන් 2019 ජුනි 28 දින දක්වා ගෙන නොතිබුණි. | අදාළ චක්‍රලේඛයට අනුව නියමිත කාලය තුළ අවශ්‍ය පියවර ගත යුතුය. | භාවිතයට ගත නොහැකි වාහන 07 ක් විකිනීම සඳහාද වාහන 07 ක හිමිකම ප්‍රධාන ලේකම්වරයාගේ නමට මාරුකිරීම සඳහා ද වාහන 06 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට ද කටයුතු කර ඇත. |
| (ඈ) | අංක NP/02/2009(07) උතුරු පළාත් පරිපාලන චක්‍රලේඛය | - | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි සේවය නියුතු නිලධාරීන් 27 දෙනෙකු වර්ෂ 07 සිට වර්ෂ 35 දක්වා කාලය තුළ වාර්ෂික ස්ථානමාරු වීම් ප්‍රතිපත්ති සඳහා යොදාගෙන නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | නිලධාරීන් 05 දෙනෙකු ස්ථානමාරුවීම් සඳහා අයදුම් කළද ස්ථාන මාරුවීම් නොලැබුණි. අනෙකුත් නිලධාරීන් සුළු සේවකයින් හේතුවෙන් යාපනය දිස්ත්‍රික්කයෙන් පිට ස්ථානමාරු කිරීම් සිදුකරනු නොලැබේ. |
| (ඉ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 0.43 | ආණ්ඩුකාරවර කාර්යාලය, කාන්තා කටයුතු අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු දෙකකට අදාළව විධායක ශ්‍රේණියේ | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය අනුව විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් අතුරු අග්‍රීමය ලබාදී නියමිත කාලය තුස |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | නොවන නිලධාරීන් 20 දෙනෙකු වෙනුවෙන් අතුරු අග්‍රිම ලබාදී තිබුණු අතර මාස 01 සිට මාස 03 දක්වා ප්‍රමාද කාලයකින් පසුව අදාළ අග්‍රිම පියවා තිබුණි. | | පියවීමට අදාළව සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවෙත උපදෙස් ලබා දෙන ලදී. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) අංක 371 | 0.72 | නියමිත කටයුතු වෙනුවෙන් ලබාදුන් අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවත්, අවස්ථා 31 කට අදාළ කාර්යය නිමවූ වහාම අග්‍රිමය පියවීමකින් තොරව දින 20 සිට දින 155 ක ප්‍රමාදයකින් නිලධාරීන් 10 දෙනෙකු විසින් අග්‍රිම පියවා තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිවට අනුකූලව කටයුතු කළ යුතු වේ. | නියමිත කටයුතු වෙනුවෙන් ලබාදෙන අග්‍රිමයන් නියමිත කාලය තුළ පියවීමට අදාළ උපදෙස් දෙපාර්තමේන්තුවට ලබාදුන් අතර මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. |
| | (ii) අංක 571 | - | මන්නාරම හා වලිකාමම් කලාප අධ්‍යක්ෂ කාර්යාල, පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ උතුරු පළාත් කෘෂි කර්ම, සත්ව නිෂ්පාදන වාරිමාර්ග ධීවර, ජල සැපයීම් සහ පරිසර අමාත්‍යාංශයෙහි තැන්පතු 84 කට අදාළව ඇති වර්ෂ දෙකකට වැඩි තැන්පතු නියාදනය නොකර රඳවාගෙන තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිවට අනුකූලව කටයුතු කළ යුතු වේ. | රු.මිලියන 1.5 කට අදාළ තැන්පතු අයත් පුද්ගලයින්ට ලබාදුන් අතර රු.මිලියන 1.35 ක් රජයේ ආදායමට මාරු කරන ලද රු.මිලියන 8.2 ක් වටිනා තැන්පතු නියමිත කාර්යයන් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

1.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

------------------------------------------------------------

උතුරු පළාත් සභාව විසින් විධිමත් අනුමැතියකින් තොරව පහත ගණුදෙනු සිදුකර තිබුණි.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | උතුරු පළාතෙහි මන්නාරම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය වෙතින් 2007 වර්ෂයේ සිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක පාසල් 06 ක සේවය නියුතු විදුහල්පතිවරුන් දෙදෙනෙකු ගුරුවරුන් 151 දෙනෙකු හා කාර්යාල කාර්යය සේවකයින් 17 ක් සේවයෙහි යෙදවා තිබුණි. මේ වෙනුවෙන් වර්ෂ 2017 සහ වර්ෂ 2018 දී මුළු එකතුව වූ රු.මිලියන 160.09 ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් හේතුවූ කරුණු හා විධිමත් අනුමැතින් විගණනය වෙත ලබාදී නොතිබීම හේතුවෙන් විගණනය සතුටුදායක ලෙස සිදුකිරීමට නොහැකි වී තිබුණි. | නියාදනය කිරීමට අවශ්‍ය පියවරයන් නියමිත කාලය තුළ සිදුකළ යුතුය. | පාලස් 6 ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත ආරම්භ කරන ලදී. මේ අනුව ස්ථාවර නියෝග 50 අනුව සියලු ගෙවීම් කලාප කාර්යාලය වෙතින් සිදුකරන ලදී. තවද, දැනට පුත්තලමෙහි ඇති පාසල්වල සේවය නියුතු ගුරුවරුන් වයඹ පළාත වෙත නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගනීමින් තිබේ. |
| (ආ) | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව යාපනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයට සම්බන්ධ සුභසාධක සංගමය වෙත පෞද්ගලික ආයතනයක් විසින් වර්ෂ 2002 ජනවාරි මස සිට ප්‍රවර්ථන වර්ෂයේ අවසානය දක්වා රු. 300 සිට රු.5000 දක්වා වූ මාසික බදු කුලී හා විවිධ ගාස්තු ලෙස ගෙවා තිබුණි. තවද, වර්ෂ 2003 සිට වර්ෂ 2015 දක්වා වූ කාලය තුළ සුභ සාධක | අදාළ මුදල් රජයේ ආදායමට බැර කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විමර්ශන කණ්ඩායමක් පත්කර ඇති අතර ඉදිරි විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. |

සංගමය වෙත පෞද්ගලික ආයතනය විසින් ගෙවන ලද ගාස්තු පිළිබඳ තොරතුරු කලාප අධ්‍යක්ෂ විසින් 2019 ජුනි 28 දින දක්වා විගණනය වෙත ලබාදී නොතිබුණි. එසේ වුවද, වර්ෂ 2012 සහ 2016, 2017 හා 2018 වර්ෂවලට අදාළව සුහසාධක සංගමය වෙත ගෙවන ලද මුළු එකතුව වූ රු. 135,600 ක මුදල අනුමැතිය නොලද ගෙවීමක් ලෙස විගණනයේදී අනාවරණය විය.

2 මූල්‍ය කළමනාකරණය

----------------------------

ආදායම් කළමනාකරණය

-----------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| --------------------- | ------------- | ------------------------------------------- |
| ප්‍රවර්ථන වර්ෂයට අදාළ ආදායම් විෂයයන් පහක අයවැයගත ආදායමට වඩා සියයට 12 සිට සියයට 52 දක්වා අඩු ප්‍රමාණයකින් රැස්කර තිබුණි. | අයවැයගත ආදායම් වෙත ළඟාවීමට අවශ්‍ය පියවරයන් ගත යුතු අතර හිඟ ආදායම් අයකර ගැනීමටද වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රවර්ථන වර්ෂයේ අතිරික්තය රු.1,140,961,099 ක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,925,209,984 ක් විය. ප්‍රවර්ථන වර්ෂයේ වැටුප් හා වේතන ගෙවීම් රු. 1,585,887,496 කින් වැඩි වීමද, පොදු තැන්පත් ගෙවීම් රු.3,088,008,760 කින් වැඩි වී තිබීමද පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේ අතිරික්තය රු.784,248,885 කින් අඩුවීමට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

4.1 කාර්යසාධනය

-----------------

රජයේ ප්‍රදාන

---------------

ප්‍රවර්ථන වර්ෂයේදී පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | අරමුදල් ප්‍රභවය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 3,081.87 | 1,841.83 | 1,240.04 |
| (ආ) | උපමාන පාදක ප්‍රදාන | 549.06 | 531.62 | 17.44 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 79.00 | 79.00 | - |
| (ඈ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 424.80 | 324.79 | 100.01 |
| (ඉ) | පොදු අධ්‍යාපන නවීකරණ කටයුතු සංවර්ධන වැඩසටහන | 27.5 | - | 27.5 |

## 4.2 ප්‍රධාන අරමුණුවලින් බැහැර ක්‍රියාකාරම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවර්ථන වර්ෂයේදී අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා කාලය තුළ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘති (ESDP) හරහා උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් 289 ක් සඳහා මුළු එකතුව වූ රු. මිලියන 5.76 ක මුදලක් වැයකර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. එසේවුවද, රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ වැඩසහනෙහි කාර්යසාධනය පදනම් කරගත් හවුල් ගිවිසුමෙන් බැහැරව එය සිදු කර තිබුණි. තවද, ශාරීරික පුහුණු සංවර්ධන වැඩසටහන සඳහා සියයට 51 ක ප්‍රමාණයක් වැය කර අනධ්‍යාන කාර්යය මණ්ඩලයේ ප්‍රාථමික හා ද්විතියික ශ්‍රේණි සඳහා පුහුණු ලබාදී තිබූ අතර එය අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා නොයෙදවූ වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | රේඛීය අමාත්‍යාංශ අරමුදල් අදාළ චක්‍රලේඛ හා කොන්දේසිවලට අනුව යෙදවීමට කටයුතු කළ යුතුය. | අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතියට අදාළව ඒ ඒ ක්‍රියාකාරම්වලට අනුව පළාත් සභාවට ලබාදී තිබූ දූරස්ථ අධ්‍යාපන හා තාක්ෂණික පුහුණු ඒකකයට අනුව (MTDU) ඒ ඒ නිලධාරියාගේ පෞරුෂය වර්ධනය කිරීමට පුහුණු පැවැත්විය යුතු වේ. විෂයානුබද්ධ කරුණු සම්බන්ධයෙන් කාලපීය මට්ටමින් හා ඒ ඒ දිස්ත්‍රික් මට්ටමින් විෂයානුබද්ධ ගුරුවරුන්ට හා නිලධාරීන්ට පුහුණු අවශ්‍යතා ලබාදුන් අතර අධ්‍යාපන අංශ සංවර්ධන පුහුණු වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට සියලුම නිලධාරීන්ට අවශ්‍ය කණ්ඩායම් පුහුණු වැඩසටහන්, වෘත්තීය පුහුණු වැඩසටහන්, පෞරුෂ වර්ධන වැඩසටහන් උතුරු පළාත් සම්බන්ධයෙන් තවදුරටත් අවශ්‍යව පවතින බැවින්ද, පෙර වර්ෂවලද මේ සම්බන්ධව අවශ්‍ය මූල්‍ය පහසුකම් නොමැති වීමට හේතුවෙන්ද සාර්ථකව නිම කිරීමට නොහැකි විය. |

4.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලබාදී තිබූ මුළු එකතුව වූ රු.මිලියන 48.2 ක් වටිනා පාලම්පිඩි කෘෂිකර්ම පුහුණු ඒකකය ඉදිකිරීම, කෘෂිකර්ම උපදේශක කාර්යාල ඉදිකිරීම, වට්ටකච්චි දිස්ත්‍රික් කෘෂි කර්ම පුහුණු ඒකකය ඉදිකිරීම සහ මන්නාරම කලාප අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් II අදියර වැඩකටයුතු ප්‍රවර්ථන වර්ෂය අවසානයේදී නිම කළ යුතු වුවද, අද දක්වා එම ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | නියමිත දිනයන්ට ඒ ඒ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | කෘෂි කර්ම දෙපාර්තමේන්තුව<br>පාලම්පිඩි කෘෂිකර්ම පුහුණු ඒකකය ඉදිකිරීම, වට්ටකච්චි දිස්ත්‍රික් කෘෂි කර්ම පුහුණු ඒකකය ඉදිකිරීම සහ කෘෂිකර්ම උපදේශක කාර්යාල ඉදිකිරීමට අදාළව ගෙවිය යුතු මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු වේගවත් කිරීමට නොහැකි විය.<br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ඉදිකිරීමට අවශ්‍ය වැලි ලබා ගැනීමට නොහැකිවීම මත හා මුදල් අග්‍රිම නොලැබීම මත ඉදිකිරීම් කටයුතු නියමිත කාලයට නිම කිරීමට නොහැකි විය. අදාළ වැඩකටයුතු වෙනුවෙන් 2019 මැයි මස අග්‍රිම ලද අතර දැනට ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවති. |

4.4 මුදල් නිදහස් කර ඇති නමුත් නියමිත කාලය තුළ නිම නොකළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කර තිබූ | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර සියලු ඉදිකිරීම් කටයතු | මෙම ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තුවලට අනුව ඉහත |

වව්නියා දිස්ත්‍රික්කයේ කබඩි කෝඩ් ඉදිකිරීම සැලසුමට අදාළව පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති මඟින් 2015 වර්ෂයට අදාළව රු.මිලියන 5 ක වටිනාකමින් නිම කළ යුතු ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන අමාත්‍යාංශ චක්‍රලේඛයෙහි 3.2 වගන්තියට පටහැනිව මුදල් කටයුතු හා පෙර කොන්ත්‍රාත් වැඩකටයුතු පරීක්ෂාවකින් තොරව ග්‍රාමීය සංවර්ධන සමිති තුනකට රු.මිලියන 5 ක ඉදිකිරීම් කටයුතු බෙදා වෙන්කර වෙන් වෙන්ව ලබාදී තිබුණි. තවද, 2015 දෙසැම්බර් 15 දින නිම කළ යුතු ඉහත ඉදිකිරීම් අද දක්වා නිමකර නොතිබුණි. තවද, වර්ෂ 2017 දී ඉහත ඉදිකිරීම් කටයුතුවලට අමතරව තවත් රු.මිලියන 5 ක මුදලක් ලබාදී තිබුණද, අද දක්වා රු.මිලියන 8 ක් වියදම් කර තිබුණි. එහෙත් කබඩි කොඩ් නිර්මාණ කටයුතු ඉටු නොකර තිබීමද අර්ධව ඉදිකර තිබූ ගොඩනැගිලි ආරක්ෂා කිරීමට නොකිරීම අවශ්‍ය පියවර නොගැනීම මත පසුගිය වර්ෂ තුනක කාලයක් තුළ රජයේ අරමුදල් නියමිත පරිදි භාවිතයට නොගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

ආරම්භ කළ යුතුය. අදාළ ක්‍රීඩාගාරය නියමිත අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

ඉදිකිරීම් සිදු කරන ලදි. තවද, මෙම ක්‍රීඩාගාරය සම්පූර්ණ ලෙස භාවිතයට ගැනීමට නම් තවත් අතිරේක අරමුදල් යොදා ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට අවශ්‍යව තිබේ.

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රවර්ථන වර්ෂයේදී එක් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු තුනක් විසින් ගිවිසුම්වලට එළඹී ඉදිකිරීම් කටයුතු 20 කට අදාළව සිදු කළ භෞතික පරීක්ෂාවේදී විගණක විසින් ගණනය කළ ඉදිකිරීම් ප්‍රමාණයන්ට වඩා වැඩියෙන් මිනුම්පත්‍ර සකස් කර තිබ්මෙන් එකතුව රු.මිලියන 2.59 ක් වැඩිපුර ගෙවා තිබුණි. | භෞතිකව ඉදිකරන ලද සත්‍ය ප්‍රමාණයන්ට මුදල් ගෙවීම් සිදු කළ යුතුය. | මෙම කරුණු සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු වෙත විමසීම් ලිපි නිකුත් කළ අතර මේ සම්බන්ධයෙන් පිළිතුරු හැකි ඉක්මනින් සපයනු ලැබේ. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලබාදී තිබූ ඉදිකිරීම් කටයුතු 7 ක කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කිරීම හේතුවෙන් එළඹී ගිවිසුම් කොන්දේසිවලට අනුව කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු.මිලියන 2.73 ක් වටිනා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකිරීම අවශ්‍ය පියවර ගත යුතුය. | අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හඳුනාගෙන විස්තරාත්මක පිළිතුරක් පසුව සපයනු ලැබේ. |

4.6 ප්‍රසම්පාදන

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් අංක 227-3366 දරන මෝටර් ලොරි රථය 2017.12.09 දින අළුත්වැඩියා කටයුතු සඳහා ඔටෝ මාස්ටර් ආයතනය වෙත ලබාදී තිබූ අතර ඒ සඳහා පසුව දිනක | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඔටෝ මෝටර් ආයතනය දිගු කාලයක සිට අක්‍රීයව පැවති අතර පසුව මිල ගණන් දැක්වූ ලිපි භාර දෙන ලදී. ඉන් පසුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අවශ්‍ය අනුමැතිය සඳහා යොමු කරන ලදී. |

එනම් 2018.10.05 දින ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන තිබීමෙන් මෙම කටයුත්ත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව සිදුකළ ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය වේ.

4.7 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 15 ක් නියමිත පරිදි අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා කාලය තුළ පියවර යන් ගෙන නොතිබුණි. | වාහන නියමිත පරිදි අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | වාහන 10 ක් ප්‍රධාන ලේකම්වරයා වෙත භාරදීමට අවශ්‍ය පියවර ගෙන ඇත. වාහන 4 ක් අලුත්වැඩියා කිරීමට දැනට පියවර ගෙන ඇත. අංක WPLB -1968 දරන ජංගම සායන රථය වෙනත් කාර්යයන් සඳහා භාවිතයට ගැනීමට තීරණය කර ඇත. |
| (ආ) | එක් අමාත්‍යාංශයක හා පළාත් පාලන ආයතන 07 කට අදාළ මුළු එකතුව වූ රු. මිලියන 208.26 ක් වටිනා ස්ථාවර වත්කම් මාස 07 ක සිට වර්ෂ 08 දක්වා භාවිතයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | රජයේ දේපළ ඵලදායීව භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | මන්නාරම් දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් උයිලාන්කුලම් ප්‍රදේශයෙහි 2013 වර්ෂයේදී එක්සත් ජාතින්ගේ සංවර්ධන අරමුදල මගින් ඉදිකර භාරදෙන ලද වී ගබඩා මධ්‍යස්ථානයක් අද දක්වා අදාළ කටයුතු වෙනුවෙන් භාවිතා නොකර ඇති බව නිරීක්ෂණය වූ | අවශ්‍යතා සැලකිල්ලට ගෙන රජයේ අරමුදල් භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර වී ගබඩා මධ්‍යස්ථාන නියමිත අරමුණු සඳහා භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | අදාළ වී ගබඩා මධ්‍යස්ථාන වී අස්වනු කාලයේදී වී ගබඩා කිරීමට භාවිතා කරන අතර අනෙක් කාලය තුළ කෘෂිකර්ම උපකරණ ගබඩා කිරීමට ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | අතර ප්‍රවර්ථන වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මුළු එකතුව වූ රු.මිලියන 2.78 ක් වටිනා තවත් වී ගබඩා මධ්‍යස්ථානයක් එම ප්‍රදේශයෙහිම ඉදිකර ඇති අතර එයද අදාළ වී ගබඩා කටයුතු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | | |
| (ඇ) | කෘෂිකර්ම හා ආහාර සංවිධානය මගින් (FOA) ආධාර ලෙස ලබාදුන් රු.මිලියන 4.93 ක් වටිනා වී අස්වනු පිරිසිදු කරන යන්ත්‍රයක් පසුගිය වර්ෂ දෙකතුළ අදාළ අරමුණු වෙනුවෙන් භාවිතයට නොගෙන උයිලාන්කුලම් වී ගබඩා මධ්‍යස්ථානය තුළ වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් රඳවාගෙන තිබුණි. | රජයේ දේපළ නියමිත කාර්යය සඳහා නියමිත කාලය තුළ ඵලදායී ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය පියවරගත යුතුය. | 2018 වර්ෂයේ සිට මෙම වී අස්වනු පිරිසිදු කරන යන්ත්‍රය භාවිතා කරමින් පවති. |
| (ඉ) | වලිකාමම් කලාප අධ්‍යක්‍ෂ කාර්යාලයට අයත් පාසල් 97 ක ප්‍රවර්ථන වර්ෂයේදී හා ඊට ඉකුත් වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩලය වෙතින් හෙළිදරව් කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු මුදල් රෙගුලාසි 757 අනුව සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි අංක 757 අනුව අවශ්‍ය පියවරයන් ගත යුතුය. | භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩල වෙතින් සමීක්‍ෂණ වාර්තා ලබා ගැනීම හා අදාළ ලිපිගොනු ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් අවශ්‍ය ඉදිරි පියවරයන් ගැනීමට ප්‍රමාද විය. ප්‍රවර්ථන වර්ෂයේදී ඊට අවශ්‍ය පියවරයක් ගන්නා ලදී. |
| (ඊ) | ප්‍රවර්ථන වර්ෂයේදී වලිකාමම් කලාප අධ්‍යක්‍ෂ කාර්යාලය මගින් මිලදී ගන්නා ලද මුළු එකතුව වූ රු.174,675 ක් වටිනා වර්ග තුනකට අදාළ කාර්යාලයීය කඩදාසි රීම් 236 ක් අඩුවෙන් පෙන්නුම් කළ අතර ප්‍රවර්ථන වර්ෂයේ අවසානයේදී මිලදී ගන්නා ලද | මිලදී ගැනීමට පෙර මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගත යුතු අතර අලාභයන් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම, නිකුත් කිරීම් හා ගබඩා ලේඛන සම්බන්ධ වාර්තා පරීක්‍ෂාවට ලක් කළ අතර ලිපිද්‍රව්‍ය අඩු වීමට අදාළ ඉදිරි පියවර ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | මුළු එකතුව වූ රු.133,000 ක් වටිනා වර්ග 11 කට අදාළ කාර්යාලීය කඩදාසි රීම් 2019 මැයි 15 දින දක්වා කාර්යාලය වෙත ලැබී නොතිබුණි. | | |
| (උ) | සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් අංක NPPF -2051 දරන කැබ් රථය 2018 නොවැම්බර් 27 දින අනතුරකට ලක්ව තිබූ අතර අනතුරට අදාළ පොලිස් වාර්තාව ලබා ගැනීමෙන් තොරව පොලසිය වෙතින් ලබාදුන් ලිපියක් හා ප්‍රාරම්භක වාර්තාව මඟින් දුන් තීරණ මත රජයේ මුදලින් රු.162,125 ක් වැයකර වාහනය අලුත්වැඩියා කර තිබුණි. වාහනය පැදවූ රියදුරා විසින් අනතුර සිදුකළ අනෙක් පාර්ශවය සමඟ “සමදානය ක්‍රමය” හරහා ගැටළුව විසඳාගෙන තිබුණි. ඒබැවින් මෙලෙස රජය විසින් දැරූ වියදම වූ රු.162,125 ක් අදාළ රියදුරාගෙන් අය නොකිරීමෙන් රජයට දැරීමට සිදුවූ අධිවැයක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | වාහන අනතුරින් වූ අලාභය අදාළ වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඌ) | කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ඉඩමේ හිමිකම මාරු කර ගැනීමකින් තොරව පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ප්‍රවර්ථන වර්ෂයේදී රු.මිලියන 24 ක් පළාත්සභා අරමුදල් වැය කර තිබුණි. | ඉඩමේ අයිතිය මාරු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. | කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතන මඟින් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල තවදුරටත් ඉදිකරමින් පවතින බැවින් අදාළ වියදම මූල්‍ය ප්‍රකාශනවල ACA -6 හි කෙරීගෙන යන වැඩවල පෙන්වා ඇත. මෙම ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වූ වහාම මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වල වටිනාකම පෙන්වනු ලැබේ. |

5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙහි ගොඩනැගිල්ලෙහි සෝපානයක් භෞතිකව ඉදිකර නොමැති වුවද, සෝපාන ක්‍රියාකරුවකු වර්ෂ 2005 දෙසැම්බර් 31 දින බඳවාගෙන තිබුණි. සෝපානයක් ඉදිනොකර මෙලෙස බඳවාගෙන තිබූ නිලධාරියා වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා නොගනෙ 2005 දෙසැම්බර් 31 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රු.මිලියන 3.1 ක් ලෙස වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව හා සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන බඳවා ගැනීම් සිදු කළ යුතුය. | අදාළ කාලය තුළ සෝපානයක් ඉදිකර නොමැති වුවද, ඖෂධ එන්නත්කරුවකු ලෙස සේවයෙහි යොදවා ඇත. |
| (ආ) | යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීමකින් තොරව තනතුරු වර්ග 10 කට අදාළව නිලධාරීන් 16 දෙනෙකු බඳවාගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව හා සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන බඳවා ගැනීම් සිදුකළ යුතුය. | තෘතීයික අංශයේ සේවය සඳහා මෙම නිලධාරීන් අනුයුක්ත කර තිබේ. |
| (ඇ) | යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙහි සුළු සේවකයින් 7 දෙනෙකු වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා කාලය තුළ රියදුරන් ලෙස හා ඖෂධ එන්නත්කරුවන් ලෙස සේවයේ යොදවා ඇති අතර එය ඔවුන්ගේ සේවා ව්‍යවස්ථාවන්ට හා බඳවාගැනීමේ | නිලධරීන් බඳවා ගත් තනතුරෙහි සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය. | රියදුරන් හා ඖෂධ එන්නත්කරුවන්ගේ පැවති පුරප්පාඩු මෙම නිලධාරීන් හරහා ඉටු කර ගන්නා ලදී. |

| | | |
|---|---|---|
| පරිපාටියෙන් බැහැරව සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) උතුරු පළාතෙහි සියයට 80 ක ප්‍රමාණයක හෙද නිලධාරීන්ද, සියයට 25 ක ප්‍රමාණයක වෛද්‍ය නිලධාරීන්ද පුරප්පාඩුව පැවතීමෙන් ග්‍රාමීය ප්‍රදේශවල මහජනතාවගේ සෞඛ්‍ය සේවා කටයුතුවලට බාධා ඇතිව තිබුණි. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | වෛද්‍ය නිලධාරීන්, දන්ත වෛද්‍ය නිලධාරීන් හා හෙද නිලධාරීන් පත් කිරීම රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. කලින් කලට මධ්‍යම රජයේ නියමයන්ට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. |

6. පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවර්ථන වර්ෂයේදී ආයතනික සමාජ වගකීම් ඉටු කිරීම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මුළු එකතුව රු.මිලියන 30 ක් වෙන්කර තිබූ අතර ඉන් සියයට 24 ක ඉතිරියක් දක්නට ලැබුණි. කෙසේවුවද, ප්‍රවර්ථන වර්ෂයේදී ඉටුකරන ලද ආයතනික සමාජ වගකීම් පිළිබඳ තොතුරු අදාළ අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත දෙපාර්තමේන්තු විසින් විගණනය වෙත ලබාදී නොතිබුණි. | සමාජ සේවා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන ලද රු.මිලියන 5 කින් 2018 වර්ෂයේදී රු.මිලියන 3.5 ක් වියදම් කරන ලදී. ඉතිරි රු.මිලියන 1.5 2019 මැයි මස දක්වා රු.මිලියන 1.1 ක් වියදම් කරන ලදී. ඉතිරි රු.මිලියන 0.4 අදාළ වව්චර්පත්‍ර 2019 ජුනි මාසයේදී ලද අතර ඒ සඳහා ගෙවීම් කරන ලදී. |

7. තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම්

-----------------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 2030 දී ළඟා කරගත යුතු තිරසර සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීමට අවශ්‍ය නියාමනයන් උතුරු පළාතේ අමාත්‍යාංශ 5ක, ආයතන 05 ක හා දෙපාර්තමේන්තු 23 ක ඉටු කිරීමට අවශ්‍ය ඉලක්ක හඳුනාගැනීම හා එම ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් සකස් කිරීම හා යෝග්‍ය සංඛ්‍යාන ඉලක්කයන් (index) සකස් කිරීම 2017 අංක 19 දරන තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමේ වැඩසටහන අනුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි අදාළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | 2019 වර්ෂයට අදාළ පළාත් සභා වාර්ෂික වර්තාව සකස් කිරීමේදී තිරසර සංවර්ධන ඉලක්කයන් හා කාර්යසාධන දර්ශකය (KPI) ඇතුළත් කර ක්‍රියාත්මක කරන ලදී. |

8. යහපාලන හා ගිණුම්කටයුතුභාවය

---------------------------------------

8.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------------

පසුගිය වර්ෂ 5 ක උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ/ලබාදුන් දිනය | සභාව විසින් සභාගත කළ දිනය |
| --- | --- | --- |
| 2013 | 2015.04.01 | 2015.11.03 |
| 2014 | 2015.12.30 | 2017.06.09 |
| 2015 | 2016.11.07 | 2018.07.25 |
| 2016 | 2018.06.19 | 2018.09.07 |
| 2017 | 2019.02.27 | - |

8.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්‍ෂණය

-----------------------------------------------------

පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් ලබාදී තිබූ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

| | විගණන නිරීක්‍ෂණ | නිර්දේශ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | ------------------------------------- |
| (අ) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට වෙන්කළ වාහනයක් තිබියදී සංචිත වාහනද භාවිතා කිරීම මත රු.325,850 ක් වටිනා අතිරේක ඉන්ධන වියදමක් දරා තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | උතුරු හා නැගෙනහිර පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළව (NELSIP - පුරනැඟුම) සිදු කරන ලද ව්‍යාපෘතිවල සිදුවූ මූල්‍ය වංචා ගණුදෙනුවල මුළු එකතුව වූ රු.මිලියන 4.42 කට අදාළව උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් පත් කරන ලද විමර්ශන මණ්ඩලයේ වාර්තාව අද දක්වා විගණනය වෙත ලබාදී නොතිබුණි. තවද, මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයා විසින් ගත යුතු වගකිව යුතු පියවරයන් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ දෙක තුළ ඉදිරි කටයුතු අකාර්යක්‍ෂමව පැවතුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II,II පන්තියට අවිධිමත් පත් කිරීම් සිදු කර තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඈ) | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වවුනියා රම්බකුලම් කාන්තා විද්‍යාලය | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ලබාදුන් රු.මිලියන 2.38 ක මුදල අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | |
| (ඉ) | සේවය සඳහා වාර්තා නොකළ ගුරුවරයකු වෙනුවෙන් වැටුප් හා වේතන ගෙවා තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඊ) | අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) පන්ති සඳහා විෂය සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව උපාධිධාරීන් පත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (උ) | වවුනියා නෙලුම්කුලම් කලෛමගල් විද්‍යාලයෙහි විදුහල්පතිවරයා විසින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් වර්ෂ 2012 සිට වර්ෂ 2015 දක්වා කාලය තුළ අනුමැතියකින් තොරව එකතු කරන ලද රු.මිලියන 2.4 ක් වටිනා මුදල් සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලය හා ප්‍රධාන ලේකම්වරයා විසින් සිදු කරන ලද විමර්ශනයෙහි වර්තාව හා එම ගණුදෙනු සම්බන්ධයෙන්ගත් ඉදිරි පියවරයන් විගණනය වෙත ලබාදී නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඌ) | 2015 ඔක්තෝබර් 16 දින සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් මන්නාරම කලාප අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ප්‍රාරම්භක වාර්තාව විගණනය වෙත අද දක්වා ලබාදී නොතිබුණි. තවද, වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට පසුගිය වර්ෂ 03 තුළ සැලකිය යුතු පියවරයන් ගෙන නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (එ) | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ බවට සහතිකයක් ලබා ගැනීමකින් තොරව ප්‍රාදේශීය සභා මඟින් කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 3.16 ක් වටිනා එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඒ) | වවුනියා පුන්තොට්ටම් ප්‍රදේශය තුළ ඉදිකරන ලද ගොඩනැගිලි තිබියදී පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පසුගිය වර්ෂ 7 තුළ ආයතන කටයුතු පවත්වා ඒ වෙනුවෙන් රු.මිලියන 2.7 ක් පෞද්ගලික ගොඩනැගිලිවලට, ගොඩනැගිලි කුලී ලෙස ගෙවා තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඔ) | පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 06 දෙනෙකු එනම් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 86 ක් අද දක්වා බඳවා නොගැනීම මත අදාළ පරිපාලන ආදායම් රැස් කිරීමට කටයුතු නියමිත පරිදි සිදු කිරීමට නොහැකි වී තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඕ) | විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව යාපනය මහ නගර සභාව විසින් කොන්ත්‍රාත් පදනම මත පශු වෛද්‍ය නිලධාරියකු හා ඉංජිනේරුවරයකු බඳවා ගෙන තිබූ අතර ඒ සඳහා මුළු එකතුව රු.මිලියන 0.84 ක් වැටුප් හා වේතන ලෙසද රු.මිලියන 0.3 ක ගමන් වියදම් ලෙසද ගෙවා තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ක) | බඳවා ගැනීමේ සුදුසුකම් වැරදි ලෙස පුවත්පත් දැන්වීම්වල දක්වමින් යාපනය මහා නගර සභාව විසින් ගිනිනිවන නිලධාරීන් 03 දෙනෙකු හා විදුලි කාර්මිකයින් 07 දෙනෙකු සේවා ව්‍යවස්ථාවට පටහැනිව 2014 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි. එසේම 2018 අගෝස්තු 15 දින පැවති උතුරු පළාත් ගිණුම්කාරක සභාවේ නිර්දේශයට අනුව උතුරු පළාත් පාළාත් පාලන කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ ඉදිරි පියවරයන් අද දක්වා විගණනය වෙත ලබාදී නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ග) | යාපනය මහා නගර සභාව විසින් වර්ෂ 2016 දී කළමනාකරණ සහකාර නිලධාරීනියකු විසින් සිදුකරන ලද රු.මිලියන 2.93 ක මුදල් වංචාව සම්බන්ධයෙන් 2018 අගෝස්තු 15 දින පැවති උතුරු පළාත් ගිණුම්කාරක සභාවේ නිර්දේශයට අනුව උතුරු පළාත් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ ඉදිරි පියවරයන් අද දක්වා විගණනය වෙත ලබාදී නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ච) | බර වාහන පැදවීම සඳහා අවශ්‍ය රියදුරු බලපත්‍රයක් නොමැති රියදුරකු හට කිලිනොච්චි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ලොරි රථයක් පැදවීමට නියම කර තිබූ අතර එම ලොරි රථය අනතුරකට පත්වීමෙන් රු.මිලියන 1.54 ක අලාභයක් සිදුව තිබුණි. මේ | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් වර්ෂ දෙකකට අධික කාලයක් අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ජ) | කිලිනොච්චි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් රු.මිලියන 4.29 ක වියදමින් අලුත්වැඩියා කරන ලද වාහන අනතුරකට මුහුණ දුන් වාහනය සම්බන්ධයෙන් අද දක්වා වගකිව යුතු ඉදිරි කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (න) | උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිසම මගින් අර්ධ රාජ්‍ය පාසලක ගුරුවරයෙකු නැවත රාජ්‍ය සේවයේ අදාළ ප්‍රතිපාදනයන් නොසලකා හැර නැවත සේවයේ පිහිටුවා තිබූ අතර නිලධාරියා වෙනුවෙන් 2014 වර්ෂයේදී රු. 428,482 ක මුදලක් වැටුප් හා වේතන ලෙස ද ගෙවා තිබුණි. | රාජ්‍ය ගිණුම්කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |